**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද මූලික පිරිවෙන්, බෞද්ධ ධර්මාචාර්ය හා කතෝලික ධර්මාචාර්ය විභාග සහතික අයදුම් කිරීම.**

වර්තමානයේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අපගේ එක්දින සේවාව තාවකාලිකව අත්හිටුවා ඇති බැවින්, පහත ක්‍රමවේදය ඔස්සේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ඉහත විභාග සහතික නිකුත් කිරීම සඳහා සැලසුම් කර ඇත.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය:**

1. අදාළ සහතික අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් පහත සබැඳිය හරහා බාගත කර ගන්න.

   සිංහල/ ඉංග්‍රීසි අයදුම්පත : https://doenets.lk/documents/downloads/certificates-application-forms/OnedayS.pdf

   දමිල අයදුම්පත : https://doenets.lk/documents/downloads/certificates-application-forms/OnedayT.pdf

2. අයදුම් පත මුද්‍රණය කර නිවැරදිව සම්පූර්ණ කරන්න. (විශේෂයෙන් ඔබේ නම, විභාග වර්ෂය, විභාග අංකය හා තැපැල් ලිපිනය යනාදිය)

I. **මූලික පිරිවෙන් විභාගය:**
   එක් වතාවකට වැඩියෙන් විභාගයට පෙනී සිට තිබේ නම්, ඒ සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත්කළ යුතු වේ.

II. **ධර්මාචාර්ය විභාගය:**
   විභාගයට අදාළ සියලු විෂයයන්ගෙන් එක්වර සමත් වී තිබිය යුතුය. නැතහොත්, ප්‍රතිඵල විභාග දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ කොට තිබිය යුතුය.

**සැ.යු: ඔබේ සහතිකය නිකුත් කරනුයේ ඔබ විභාගය සඳහා පෙනී සිටි නමින් පමණි.**

3. ඔබ දැන් ලබාගැනීමට අපේක්ෂා කරන සහතික වර්ගය හා පිටපත් ගණන අනුව(උපරිම පිටපත් ගණන 3කි) අදාළ ගෙවීම් ලංකා බැංකුවේ පහත සඳහන් ගිණුම් අංකයට බැර කර අදාළ රිසිට් පත හෝ තිර සටහන (screenshot - මාර්ගගත ගෙවීම් සඳහා පමණි) ලබාගන්න.

| සහතික වර්ගය | පිටපත් 1 | පිටපත් 2 | පිටපත් 3 |
|---|---|---|---|
| මෙරට භාවිතය සඳහා. | රු. 700/= තැපැල් ගාස්තු ඇතුළත්ය. | රු. 1000/= තැපැල් ගාස්තු ඇතුළත්ය. | රු. 1300/= තැපැල් ගාස්තු ඇතුළත්ය. |
| විදේශීය භාවිතය සඳහා (විදේශ කටයුතු අමාත්‍යාංශයයෙන් ලබා ගැනීමට) | රු. 600/= ලබාගත හැකි වන්නේ එක් පිටපතක් පමණි. | | |
| Foreign Country (ලියාපදිංචි ගුවන් තැපැල මගින් යැවීම සඳහා ) | රු. 900/= (තැපැල් ගාස්තු රු.300/= ඇතුළත්ය.) | | |

ලංකා බැංකුවේ ගිණුම් අංකය : **7041228**
ගිණුමේ නම : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ශාඛාව : බත්තරමුල්ල ශාඛාව

4. doecertificates@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට පහත සඳහන් ලේඛන ඊමේල් කර එවන්න.
   - නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත.
   - මුදල් ගෙවන ලද රිසිට් පත හෝ තිර සටහන (screenshot).
   - ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පැහැදිලි ඡායාරූප හෝ ස්කෑන් පිටපත්.

5. ඊමේල් පණිවිඩයේ මාතෘකාව(title) සඳහන් කරන ස්ථානයේ "Exam Certificates" ලෙස සටහන් කර "සහතික අයදුම් කරන දිනය" සහ "දුරකථන අංකය" පමණක් ඇතුළත් කරන්න.

   - මෙරට භාවිතය සඳහා ඉල්ලුම් කරන ලද සහතික පත්‍ර ඉල්ලුම් කර, දින තුනක් ඇතුළත අයදුම්පතෙහි සඳහන් ලිපිනයට තැපැල් දෙපාර්තමේන්තුවේ speed post සේවාව හරහා තැපැල් මගින් එවන අතර විදේශීය භාවිතය සඳහා ඉල්ලුම් කරන ලද සහතික පත්‍ර විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යවනු ලැබේ.

   - එම සියලු තොරතුරු හා සහතික යොමු අංක ඔබගේ ඊමේල් ලිපිනයට පිළිතුරු පණිවිඩයක් ලෙස එවනු ලැබේ.

   - ඉහත ක්‍රියාපටිපාටිය යටතේ සහතික නිකුත් කළ හැක්කේ අයදුම්කරු අදාළ තොරතුරු (උදා: විභාගයේ නම , විභාගයේ වර්ෂය , විභාග අංකය යනාදිය) **නිවැරදිව** ලබා දී ඇත්නම් පමණි.

   - අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් හෝ රිසිට්පත් අඩංගු ඉල්ලීම් හා අවශ්‍ය සියලු ලේඛන එවා නොමැති ඉල්ලීම් පෙර දැනුම්දීමකින් තොරව අවලංගු කිරීමට සිදු වේ.

   - **සහතිකවල පිටපත් ඊ-මේල් මගින් ලබාදීම සිදු නොකෙරේ.**

   - සහතික නිකුත් කරනු ලබන්නේ විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් නිල වාර්තා මෙම දෙපාර්තමේන්තුව සතුව තිබේ නම් පමණි.